**2022 නොවැම්බර් මස18 වන දින පැවති**

**පනස් පස්වන මහ සභා රැස්වීමේ කෙටුම්පත් වාර්තාව**

**දිනය :-2022.11.18**

**ස්ථානය :- නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය සභාව**

**වේලාව :- පෙ.ව 10.00**

**සහභාගී වූ :-**

| | | | |
|---|---|---|---|
| 01. | ගරු සභාපති | එස්.බී කුමාරදාස මැතිතුමා | ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) |
| 02. | ගරු උප සභාපති | එම් සරත් ප්‍රේමචන්ද්‍ර මැතිතුමා | ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) |
| 03. | ගරු මන්ත්‍රී | බී.ඒ.ජී.එම්.කේ.ජී.ජී කුමාරි මැතිනිය | ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) |
| 04. | ගරු මන්ත්‍රී | කේ.ඒ ශාන්ත මැතිතුමා | ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) |
| 05. | ගරු මන්ත්‍රී | ජේ.ඒ.ඩී විමලසිරි මැතිතුමා | ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) |
| 06. | ගරු මන්ත්‍රී | පී.ටී සිරිසේන මැතිතුමා | ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) |
| 07. | ගරු මන්ත්‍රී | බී.බී.ඊ ගයාන් චාමර මැතිතුමා | ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) |
| 08. | ගරු මන්ත්‍රී | එච්.ඩබ්.ජී.එන් කුමුදු වසන්ති මැතිනිය | ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) |
| 09. | ගරු මන්ත්‍රී | කේ.ඒ සංජීව මැතිතුමා | ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) |
| 10. | ගරු මන්ත්‍රී | ජේ.ඒ ජයවර්ධන මැතිතුමා | ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) |
| 11. | ගරු මන්ත්‍රී | ඩී.පී බන්දුලසේන මැතිතුමා | ( ශ්‍රී.ල නි.ප) |
| 12. | ගරු මන්ත්‍රී | එස්.ඒ.කේ.පී ගුණවර්ධන මැතිතුමා | ( ජ.වි.පෙ) |
| 13. | ගරු මන්ත්‍රී | කේ. හැරිසෙන්ස් මැතිතුමා | ( ජ.වි.පෙ) |
| 14. | ගරු මන්ත්‍රී | ජී.ඒ නෙළුම් මැතිනිය | ( එ.ජා.ප) |
| 15. | ගරු මන්ත්‍රී | ආර්.එම් කුමාරසිංහ මැතිතුමා | ( එ.ජා.ප) |
| 16. | ගරු මන්ත්‍රී | ඩී.එම්.එන් සුභාෂිණී බංඩාර මැ.තිනිය | ( එ.ජා.ප) |
| 17. | ගරු මන්ත්‍රී | එම්.ඒ විමලසුරේන්ද්‍ර මැතිතුමා | ( එ.ජා.ප) |
| 18. | ගරු මන්ත්‍රී | ආර්.එම්.අයි ජනක ශ්‍රීමාලි මැතිනිය | ( එ.ජා.ප) |
| 19. | ගරු මන්ත්‍රී | වයි.එම් ගාමිණී බංඩාර මැතිතුමා | (ස්වාධීන කණ්ඩායම) |

**දන්වා සහභාගී නොවූ:-**

| | | | |
|---|---|---|---|
| 01. | ගරු මන්ත්‍රී | පී.එස්.බී සිරිවර්ධන මැතිතුමා | ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) |
| 02. | ගරු මන්ත්‍රී | පී කරුණාරත්න මැතිතුමා | ( ශ්‍රී.ල නි.ප) |

**නිළධාරීන්:-**

| | | |
|---|---|---|
| 01. | ලේකම් | ජේ.ඒ.එස්.උදයසිරි මයා |
| 02. | විෂය භාර කළමණාකරන සේවා නිළධාරී | කේ.ජී.ඒ සම්මානි මෙය |

<u>ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා</u> ගරු උප සභාපතිතුමා ඇතුළු ගරු මන්ත්‍රීතුමන්ලා හා ගරු මන්ත්‍රීතුමියන්ලා වෙත සුභ උදෑසනක් ප්‍රාර්ථනය කරමින්, ඉතාම ආදරයෙන් ගෞරවයෙන් පිළිගනිමින් න්‍යායපත්‍රානුකූලව සභාවේ වැඩ කටයුතු ආරම්භ කරන ලදී.

**අ) මහ සභා වාර්ථාව සභා සම්මත කර ගැනීම.**

**<u>2022.10.18 වන දින මහ සභා කෙටුම්පත් වාර්ථාව</u>**

<u>ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා</u> 2022.10.18 දින පැවැත් වූ මහ සභා රැස්වීමේ කෙටුම්පත් වාර්තාව ප්‍රාදේශීය සභා රීතීන්ට අනුව ඔබ වෙත ලැබීමට සළස්වා ඇති බැවින් එම වාර්ථාවේ, ශිෂ්‍යත්ව සම්මන්ත්‍රණය සඳහා සභා අරමුදලින් ලබා දිය යුතු මුදල උපරිම රුපියල් 40,000.00 ක් ලෙස අන්තර්ගත විය යුතු බව හා අඩුපාඩු ඇත්නම් එම සංශෝධනයන්ට ද යටත්ව සභා සම්මත කර ගන්නා ලෙස ප්‍රකාශ කරමින් 2022.10.18

මහ සභා කෙටුම්පත් රැස්වීම් වාර්ථාව සංශෝධනයන්ට යටත්ව සහා සම්මත කිරීම සුදුසු බවට යෝජනා කරන ලදී.

**සංශෝධන**

ගරු මන්ත්‍රී ඩී.පී බන්දුලසේන මැතිතුමා තමා සිදුකරන ලද ප්‍රකාශයේ "කළ නොහැකි දේ කරන සභාපතිවරයකු ලෙස" නොව "කළ යුතු දේ කරන සභාපතිවරයෙකු ලෙස" හා "අස්වනු නෙලා ගත් පසු ගොවියෝ ගෙදර යති පඹයෝ ගොවිබිම්වල ඉතිරි වෙති " යනුවෙනුත් සංශෝධනය විය යුතු බව ප්‍රකාශ කරන ලදී.

ගරු මන්ත්‍රී කේ. හැරිසෙන්ස් මැතිතුමා ශිෂ්‍යත්ව සම්මන්ත්‍රණය සම්බන්ද ප්‍රකාශනයේ දී නොමිලේ සම්මන්ත්‍රණ මාලාවක් පැවැත්වීම ලෙස සඳහන් වී ඇති අතර එය සම්මන්ත්‍රණයක් ලෙස සංශෝධනය විය යුතු බව ප්‍රකාශ කරන ලදී.

ගරු උප සභාපති එම් සරත් ප්‍රේමචන්ද්‍ර මැතිතුමා ඉදිරිපත් වූ සංශෝධනයන්ට යටත්ව 2022.10.18 වන දින පැවති මහ සභාවේ වාර්ථාව සංශෝධන වලට යටත්ව සහා සම්මත කිරීම සුදුස බවට ගරු සභාපතිතුමා විසින් ගෙන ආ යෝජනාව ස්ථිර කරන ලදී.

ඒ අනුව 2022.10.18 වන දින මහ සභා රුැස්වීම් කෙටුම්පත් වාර්ථාව සංශෝධනයන්ට යටත්ව සභා සම්මත විය.

**අ) සභාපතිතුමන් විසින් කරනු ලබන විශේෂ නිවේදනය**

නැත.

**ආ) ප්‍රාදේශීය සභාව වෙත අමතා එවන ලද සංදේශ පෙත්සම්, පැමිණිලි සහ සන්නිවේදන**

නැත.

**ඇ) යථා පරිදි කල් දී ඇති ප්‍රශ්ණ**

නැත.

**ඉ) යථා පරිදී කල් දී ඇති යෝජනා**

**01. 2022 දෙසැම්බර් මස සේවකයින්ගේ අතිකාල තක්සේරු වාර්ථා අනුමත කිරීම.**

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා 2022 දෙසැම්බර් මසට අදාලව කාර්යය මණ්ඩලය විසින් අතිකාල ඉල්ලීම් කර ඇති අතිකාල තක්සේරු වාර්ථා සභාවට ඉදිරිපත් කරමින් අදාල සේවකයින් වෙත අතිකාල තක්සේරු වාර්තා අනුමත කිරීම සුදුසු බවට යෝජනා කරන ලදී.

| **2022 නොවැම්බර්** | | පැය ගණන |
|---|---|---|
| 01. එස්.එම් මහරගෙදර මිය | (සහකාර ගිණුම් නිළධාරී) | 40 |
| 02. ඩී.යූ.දිසානායක මයා | (කළ.සේවා නිළධාරී) | 60 |
| 03. එම්.එස්.එම් ගුණවර්ධන මිය | (කළ: සේවා නිළධාරී) | 60 |
| 04. කේ.ජී.ඒ සම්මානි මෙය | (කළ.සේවා නිළධාරී) | 40 |
| 05. එම්.ඒ.දිසානායක මිය | (කළ.සේවා නිළධාරී) | 40 |
| 06. ටී.එච්.ආර් තාරක මයා | (කළ සහකාර (ආවරණ) | 40 |
| 07. ඒ.ඒ පියතිස්ස මයා | (මං.කම්කරු (මුරකරු ආවරණ) | 75 |
| 08. ඩබ්.එස්.එස්.ඒ.පෙරේරා | (රියදුරු) | 75 |
| 09. ඩී.එම්.ගුණරත්න බංඩා | ( වැඩ පරිපාලක) | 75 |
| 10. ටී.එච්.ඩී.ඩී පෙරේරා මයා | (මුරකරු(ආවරණ) | 75 |
| 11. බන්දුල දිසානායක | (මුරකරු ආවරණ) | 40 |
| 12. චමින්ද කුමාර | (මුරකරු) | 75 |
| 13. කේ.නයනානන්ද | (ජල පෙරණ නෙළුබැව) | 40 |
| 14. කේ.ජී.ජී.ඩී.ගමගේ | ( පුස්තකාල සහයක) | 40 |

ගරු මන්ත්‍රී ඩී.පී බන්දුලසේන මැතිතුමා 2022 දෙසැම්බර් මසට අදාල අතිකාල ඉල්ලුම් කර ඇති සේවකයින්ගේ අතිකාල තක්සේරු වාර්ථා අනුමත කිරීම සුදුසු බවට ගරු සභාපති තුමා කල යෝජනාව ස්ථිර කරන ලදී.

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා අතිකාල තක්සේරු වාර්තා අනුමත කිරීමේ යෝජනාව සම්බන්ධයෙන් යම් විරෝධතාවයක් පවතීද යන්න විමසූ අතර කිසිදු විරෝධතාවයක් ඉදිරිපත් නොවූ බැවින් 2022 දෙසැම්බර් මස අතිකාල ඉල්ලුම්කල සේවකයින් වෙත අතිකාල තක්සේරු වාර්ථා අනුමත කිරීමේ යෝජනාව පැමිණ සිටි සියළු මහජන නියෝජිතයන්ගේ එකඟතාවයෙන් සභා සම්මත විය.

**02.ගලි බවුසර සඳහා ගෙවන ලද මුදල් නැවත ලබා ගැනීම.**

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතමා ශ්‍රාවස්තිපුර, වදාගම,කොඩිගලගම පදිංචි පී.එස්.එම් දිල්ශාන් රත්නායක යන අය ගලි බවුසරයේ සේවාව ලබා ගැනීම සඳහා මුදල් ගෙවා ඇති නමුත්, ගලි වල පස් වී තිබීම හේතුවෙන් එම සේවාව ඉටු කර ගැනීමට නොහැකි විය. එම නිසා ඒ සඳහා වැය වූ මුදල් ලබා දීමේදි ප්‍රවාහන ගාස්තු අය කර ලබා දීම සුදුසු බවට යෝජනා කරන ලදි.

ගරු මන්ත්‍රී බී.බී.ථ් ගයාන් චාමර මැතිතුමා ගරු සභාපතිතුමා විසින් මහා සභාවට ඉදිරිපත් කරන ලද ගලි බවුසරය සඳහා ගෙවන ලද මුදල් ප්‍රවාහන ගාස්තු අය කර නැවත ලබා දීම සුදුසු බවට ස්ථිර කරන ලදී.

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතමා ඉදිරිපත් කල යෝජනාව සම්බන්ධයෙන් යම් විරෝධතාවයක් පවතින්නේ ද යන්න විමසූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූ බැවින් ගලි බවුසර සඳහා ගෙවන ලද මුදල් ප්‍රවාහන ගාස්තු අය කර නැවත ලබා දීමේ යෝජනාව පැමිණ සිටී සියළු මහජන නියෝජිතයන්ගේ එකඟතාවයෙන් සභා සම්මීත විය.

**03. වැසිකිළිය සඳහා කොමඩ් කට්ටලයක් ලබා ගැනීම.**

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතමා ශ්‍රාවස්තිපුර, ශ්‍රාවස්ති වත්ත පදිංචි උපේක්ෂ සංදීප යන අය 2021 වසරේ දී රිය අනතුරකට භාජනය වී දකුණු පාදය සම්පූර්ණයෙන්ම ඉවත් කිරීමට සිදු වී ඇති අතර ඔහු පවුලේ උදවිය සමග මේ වන විට ස්ථිර රැකියාවක් නොමැතිව දැඩි ආර්ථික අපහසුතා මැද ජීවත් වන බවත්, රිය අනතුරෙන් පසු ඇතිවූ සෞඛ්‍ය ආබාධය නිසා බට භාවිතයෙන් මළ මූත්‍රා සිදුකරන බවත්, ඉදිරියේ දී වෛද්‍යවරුන් එම බට ඉවත් කිරීමට තීරණය කර ඇති අතර එහිදී වැසිකිළි යාම සඳහා කොමඩ් එකක් අවශ්‍ය විය ඇති බවත්, මේ සඳහා අවධානය යොමු කර කොමට් කට්ටලයක් ලබා දීමට අවශ්‍ය කටයුතු සිදු කර දෙන මෙන් ඉල්ලා සිටින ලදී. එහිදී ඔහුගේ රෝගාබාධය සහ ආර්ථික අපහසුතා සලකා බලා කොමඩ් කට්ටලයක් ලබා දීම සුදුසු බවට යෝජනා කරන ලදී.

ගරු මන්ත්‍රී කේ.ඒ සංජීව මැතිතුමා එම තරුණයා කුමුදු මන්ත්‍රීතුමාගේ නිවස අසල පදිංචි අතර නාවික හමුදාවේ රැකියාව අපේක්ෂාවෙන් සම්මුඛ පරීක්ෂණය ද සමත් වී කොළඹ යැමට සිටීමේදී රිය අනතුරකට භාජනය වී තවමත් මූත්‍රා බට ආදිය දමා අසනීප තත්ත්වයේ පසුවන බවත්, මව සහ නැගණිය සමග ජීවත්වන බවත් එම නිසා ඔවුන්ගේ අසරණ කම සැලකිල්ලට ගෙන අදාළ උපකරණ ලබාදීම සුදුසු බවට ස්ථිර කරන ලදී.

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතමා ඉදිරිපත් කල යෝජනාව සම්බන්ධයෙන් යම් විරෝධතාවයක් පවතින්නේ ද යන්න විමසූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූ බැවින් වැසිකිළිය සඳහා කොමඩ් කට්ටලයක් ලබා දීමේ යෝජනාව පැමිණ සිටී සියළු මහජන නියෝජිතයන්ගේ එකඟතාවයෙන් සභා සම්මීත විය.

**04.පෙර පාසල් ගොඩනැගිල්ල සඳහා සෙවිලි තහඩු ලබාගැනීම.**

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතමා නාච්චාදූව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 274 උතුරු කළුවිල ග්‍රාම නිලධාරි වසමට අයත් දකුණු කලුවිල හිදෝගම පිහිටි සමනල පූර්ව ළමාවිය අධ්‍යාපන සංවර්ධන මධ්‍යස්ථානයේ ගොඩනැගිල්ලේ වහල මේ වන විට වඳුරන් විසින් කඩා විනාශ කර ඇති බවත්, එහිදී දරුවන්ගේ සහ ගුරුතුමියගේ පොත්පත් සහ නිර්මාණ විනාශ වෙමින් පවතින බවත්, මේ තුළින් දරුවන්ගේ ඉගෙනීම් කටයුතු සඳහා ද බාධාවක් ඇතිවී තිබෙන බවත් මේ තත්ත්වය සැලකිල්ලට ගෙන වහලය සඳහා සෙවිලි කිරීමට සෙවිලි තහඩු හතක් පමණ ලබාදෙන මෙන් ඉල්ලා සිටින බව පවසන ලදී.
මෙම යෝජනාව සාධාරණ යෝජනාවක් වුවත්, වර්තමානයේ පවතින මිල ගනන් හා ආර්ථික තත්වය හමුවේ සෙවිලි තහඩු ලබා දීමේ ගැටලු කාරී ගැටලුකාරී තත්ත්වයක් ඇති බවත් පවසන ලදී.

ගරු මන්ත්‍රී පී.ටී සිරිසේන මැතිතුමා මෙම පර පාසලේ දරුවන් වැස්ස ආදිය හමුවෙ ඉතා අපහසුතාවයෙන් අධ්‍යාපනය ලබන අතර , පරණ සෙවිලි තහඩු හෝ ලබා දී පෙර පාසලේ වහලය නොතෙමෙන ලෙස සකසා දෙන මෙන් ඉල්ලා සිටි අතර , ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව ස්ථිර කරන ලදී.

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතමා තාක්ෂණ නිලධාරි මෙම පෙර පාසල වෙත යවා පරීක්ෂාකර බලා සුදුසු වැඩපිළිවෙළක් යෙදීම සඳහා කටයුතු කරන බවත්, මේ සම්බන්ධයෙන් ගරු මන්ත්‍රීතුමන්ලා ගේ සහ ගරු මන්ත්‍රීතුමියන්ලාගෙ විරෝධතාවයක් තිබේද යන්න විමසූ අතර විරෝධතා කිසිවක් නොතිබූ බැවින් පෙර පාසලට සෙවිලි තහඩු ලබා දීමේ යෝජනාව පරීක්ෂාකර බලා සුදුසු වැඩපිළිවෙළක් යෙදීම සඳහා සභා සම්මත විය.

**05.ප්‍රාදේශීය සභාව සතු දේපළ 2023 වර්ෂයට බදූ දීම සඳහා දෙවන වර මිල ගණන් කැඳවීම.**

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතමා ප්‍රාදේශීය සභාව සතු දේපළ 2023 වර්ෂයට බදු දීම 2022.11.15 දින ටෙන්ඩර් පත් විවෘත කිරීම සිදු කළ අතර එහිදී ලංසුපත් ඉදිරිපත් කර නොමැති දේපළ ප්‍රාදේශීය වශයෙන් දෙවන වර මිල ගණන් කැඳවීම සඳහා සහා අනුමැතියට ඉදිරිපත් කරන බවත් , එහිදී නව ස්ථානයක් ලෙස 5 ඇළ මංසන්ධියේ මුහුදු මාළු ලැල්ල ඇතුලත් කර තිබෙන බවත් පවසන ලදි.

ගරු මන්ත්‍රී ආර්.එම් කුමාරසිංහ මැතිතුමා ශ්‍රාවස්තිපුර කඩ කාමර ගිවිසුම් වලට අනුව බදූ ගත් අය සිටින අතර මේ ආකාරයෙන් ටෙන්ඩර් කැඳවන ලද්දේ බදූ නොගෙවන නිසා ද යනුවෙන් විමසන ලදී. මන්ද එම ගිවිසුම් වල නැවත ටෙන්ඩර් කැඳවීමක් පිළිබඳව සඳහන් වී නොමැති බවත් ,ඒ අනුව ඔවුන් මෙය නියමානුකූලව බදූ ගෙවන්නේ නම් ඒ සඳහා නැවත ටෙන්ඩර් කැඳවීමක් සිදු කිරීම සුදුසු නොවන බවත් පවසන ලදී. මාළු ලැලි සම්බන්ධයෙන් ගත් විට සමහර මාළු ලැලිවල දැනටත් මාළු ව්‍යාපාරය සිදු කරන අතර ඔවුන් ටෙන්ඩර් ලබාගැනීමට නොපැමිණියේනම්, අදාල පුද්ගලයින් සඳහා ලිඛිත දැනුම්දීමක් සිදු කිරීම සුදුසු බවත් එසේ නොවන්නේ නම් නැවත ටෙන්ඩර් කිරීම මගින් ලබාගන්නා වෙනත් පුද්ගලයින් එම ස්ථානවල ව්‍යාපාර සිදු කිරීමේදී අදාළ පාර්ශ්වයන් අතර ගැටුම් ඇති වීමට අවස්ථාවන් තිබෙන බවත් ප්‍රකාශ කරන ලදී.

ගරු මන්ත්‍රී ඩී.පී බන්දුලසේන මැතිතුමා ශ්‍රාවස්තිපුර හන්දියෙ මාළු ලැල්ල සඳහා ටෙන්ඩර කරුවන් දෙදෙනකු ඉදිරිපත් වූ අතර ප්‍රාදේශීය සභාවේ ලාභ ඉපයීමේ අරමුණෙන් වැඩි ටෙන්ඩර්කරු සඳහා ටෙන්ඩරය ලබා දුන්නද ටෙන්ඩරය ලබා නොගත් අනිත් පුද්ගලයාගේ ඉල්ලීම මත ඔහු සඳහාද මාළු ලැල්ලක් ස්ථාපිත කර දීමට කටයුතු යොදා ඇති බවත්, මේ තුළින් ද ගැටුම් නිර්මාණය වන බවත් ප්‍රකාශ කරන ලදී. ස්ථාන බදු දීම සඳහා ගැසට් පත්‍රය නිකුත් කිරීමේදී වෙළඳ ස්ථාන නිසියාකාරව හඳුනාගෙන ගැසට් කළ යුතු බවත්, ශ්‍රාවස්තිපුර කඩ කාමර හිමි භූමිය, ජයන්ති විහාරයට අයිති භූමියක් බවත්, එම භූමියේ අයිතිය පිළිබඳව ඔප්පු තුළින් එම ජනතාව ඉදිරිපත් කිරීම සඳහා සූදානම් වී ඇති බවත් ප්‍රකාශ කරන ලදී.

ගරු මන්ත්‍රී බී.බී.ඊ ගයාන් චාමර මැතිතුමා ටෙන්ඩර් දමන ලද මාළු ලැලි අසල තවත් මාළු ලැලි ස්ථාපිත කිරීම තුළින් ටෙන්ඩර් ලබා ගන්නා මාළු ලැලි හිමියන් අධෛර්යයට පත් වී ඇති බවත් , මේ සඳහා විසඳුමක් ලෙස එම අනෙක් මාළු ලැලි හිමියන් හට ටෙන්ඩර් මගින් මාළු ලැලි ලබා ගැනීමේ පටිපාටිය පිළිබඳව දැනුවත් කර මාළු ලැලි දමන ලෙසට දැනුවත් කිරීම සුදුසු බවත් එසේ නොවන්නේ නම් අදාළ නීත්‍යානුකූල කටයුතු සිදුකිරීම සුදුසු බවත් ප්‍රකාශ කරන ලදී.

ගරු මන්ත්‍රී එස්.ඒ.කේ.පී ගුණවර්ධන මැතිතුමා ටෙන්ඩර් දෙවන වර ඉදිරිපත් කිරීමෙන් අනතුරුව ද ලබා නොගන්නේ නම් ඊළඟ පියවර කුමක් ද යනුවෙන් විමසන ලදී. එහිදී පොලිසිය සහ අදාල නිලධාරීන් ගොස් ඔවුන් සමග ගැටුම් ඇති කර ගැනීම නුසුදුසු බවත් ඒ සඳහා කොට්ඨාශය මන්ත්‍රීතුමා හෝ මන්ත්‍රීතුමිය හරහා දැනුවත් කර ටෙන්ඩරය ලබා දීම සුදුසු බවත් යෝජනා කරන ලදී.

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතමා ප්‍රාදේශීය සභා පනතට අනුව වාර්ෂිකව ටෙන්ඩර් කැඳවීම අත්‍යවශ්‍ය බැවින් ටෙන්ඩර් කැඳවා වාර්ෂිකව බදු පදනමෙන් ලබාදීමට හැකි බවත්, ගරු මහා සභාවේ අනුමැතියට යටත්ව වසර තුනක් දක්වා බදු පදනමින් ලබාදීමට හැකි බවත්, විෂය භාර අමාත්‍යවරයාගේ අනුමැතියට යටත්ව වසර පහක් සඳහා ද බදු පදනම ලබා දිය හැකි බවත් පවසන ලදී. ඒ අනුව මෙය මේ වන තෙක් යාවත්කාලීනව සිදු නොවූ අතර මේ වසරේ දී නැවත ටෙන්ඩර් කැඳවන ලද්දේ ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතියට යටත්ව ටෙන්ඩර් ලබාගන්නා පුද්ගලයින් සඳහා වසර පහක් සඳහා බදු පදනමෙන් ලබාදී ඒ වසර 5 ඇතුළත දී අසාදු ලේඛන ගත නොවුණහොත් ඉදිරියේදීද බදු පදනමෙන් ලබාදෙන බවත් ප්‍රකාශ කරන ලදී.
ශ්‍රාවස්තිපුර කඩ කාමර පිහිටි භූමිය ජයන්ති විහාරය සතු භූමියක් නොවන අතර එම භූමිය පවතින්නේ රක්ෂිතයේ කොටසක බවත් ප්‍රකාශ කරන ලදී.
ඒ අනුව මෙම ස්ථාන ටෙන්ඩර් කිරීම සුදුසු බවට ගරු මහ සභාවට යෝජනා කරන ලදී.

ගරු මන්ත්‍රී බී.ඒ.ජී.එම්.කේ.ජී.ජී කුමාරි මැතිනිය ගරු සභාපතිතුමා විසින් ගෙන ආ 2023 වර්ෂයට බදු දීම සඳහා දෙවන වර මිල ගණන් කැඳවීමේ යෝජනාව ස්ථිර කරන ලදී.

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතමා ඉදිරිපත් කල යෝජනාව සම්බන්ධයෙන් යම් විරෝධතාවයක් පවතින්නේ ද යන්න විමසූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූ බැවින් ප්‍රාදේශීය සභාව සතු දේපළ 2023 වර්ෂයට බදු දීම සඳහා දෙවන වර මිල ගණන් කැඳවීමේ යෝජනාව පැමිණ සිටි සියළු මහජන නියෝජිතයන්ගේ එකඟතාවයෙන් සභා සම්මත විය

**06. නෙලුබැව නගරයේ විදුලි ට්‍රාන්ස්ෆෝමරය ඉවත් කිරීම.**

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතමා නෙලුබැව නගරයේ විදුලි ට්‍රාන්ස්ෆෝමරය අනාරක්ෂිත බව හා නගර අලංකරණයට බාධාවක් බැවින් ඉවත් කිරීම සුදුසු බවට මහ සභාවට යෝජනා කරන ලදී.

ගරු උප සභාපති එම් සරත් ප්‍රේමචන්ද්‍ර මැතිතුමා මෙම ට්‍රාන්ස්පෝමරය ඉවත් කිරීම සම්බන්ධයෙන් මහජන උපයෝගීතා කොමිසමට දැනුවත් කළ අතර ඔවුන් විදුලිබල මණ්ඩලයට හා නාගරික සංවර්ධන අධිකාරියට හා තමා හට ලිපියක් ඉදිරිපත් කර ඇති අතර එහි සඳහන් වන්නේ සභාවේ අනුමැතියෙන් සිදු කිරීමට හැකියාවක් පවතින බවත්, එමෙන්ම විදුලිබල මණ්ඩලයට හා නාගරික සංවර්ධන අධිකාරියට මෙය ඉවත් කිරීම සඳහා මුදල් ප්‍රතිපාදන නොමැති ලෙස සඳහන් කර තිබූ බවත් , මෙය එම නගරයේ අලංකරණයටත් බාධාවක්ද බවත් ප්‍රකාශ කරන ලදී. මෙය ලක්ෂ 7.5 කින් පමණක් සිදු කිරීමට හැකි බවත් ප්‍රකාශ කරන ලදී.

ගරු මන්ත්‍රී ආර්.එම් කුමාරසිංහ මැතිතුමා මෙම ගැටළුව මහජන පීඩනයක් ඇතිවන දෙයක් බවත්, මෙම ස්ථානයේ බොහෝ අනතුරු ද සිදු වන බවත්, ට්‍රාන්ස්ෆෝමරයක් සවි කර එයින් අනතුරක් සිදුවන්නේ නම් විදුලිබල මණ්ඩලයට එම වගකීමෙන් ඉවත්වීම සුදුසු නොවන බවත්, විදුලිබල මණ්ඩලය සතුව බොහෝ අරමුදල් පවතින බවත් කර්මාන්ත ශාලා හිමියන්ගේ උවමනාවට කර්මාන්තශාලා සඳහා ට්‍රානට්‍රාන්ස්ෆෝමර දැමීමට ඔවුන්ට හැකියාවක් පවතින්නේ නම් ජනතාවට පීඩාවක් සිදු වීම හා නාගරික අලංකරණයට බාධාවක් වන නෙළුබැවේ මෙම ට්‍රාන්ස්ෆෝමරය හා විජයපුර වටරවුමේ පිහිටි ට්‍රාන්ස්ෆෝමරය ඉවත් කර ගැනීමට විදුලිබල මණ්ඩලයට නැවත දැනුවත් කිරීම යෝග්‍ය බවටත් , එලෙස ඉවත් කිරීමට නොහැකි වුවහොත් සභා අරමුදලින් හෝ එම ට්‍රාන්ස්ෆෝමර දෙක ඉවත් කර පිළියමක් යෙදීම සුදුසු බවට ප්‍රකාශ කරන ලදී. ඒ අනුව ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන යෝජනාව ස්ථිර කරන ලදී.

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතමා ඉදිරිපත් කල යෝජනාව සම්බන්ධයෙන් යම් විරෝධතාවයක් පවතින්නේ ද යන්න විමසූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූ බැවින් නෙලුබැව නගරයේ විදුලි ට්‍රාන්ස්ෆෝමරය අනාරක්ෂිත බව හා නගර අලංකරණයට හාධාවක් බැවින් ඉවත් කිරීම සඳහා වූ යෝජනාව පැමිණ සිටි සියළු මහජන නියෝජිතයන්ගේ එකඟතාවයෙන් සභා සම්මත විය.

**06. පුරනැගුම ව්‍යාපෘතියේ මුදල් සම්බන්ධව.**

<u>ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතමා</u> 2016 වර්ෂයේදී පුරනැගුම ව්‍යාපෘතිය සඳහා ලද මුදල් වලින් රු. 1,852,904.49 ක මුදලක් අදාළ ජංගම ගිනුමේ මේ වන විට ඉතිරි වී පවති. එම මුදල් වලින් ස්ථාවර තැන්පතුවක් ආරම්භ කිරීම සුදුසු බවට යෝජනා කරන ලදී.
මෙම මුදල් අභයපුර කාපට් මාර්ගය සම්බන්ධ ව්‍යාපෘතියට ගෙවීම් කිරීම සඳහා ප්‍රාදේශීය සභාව වෙත ලැබී ඇති අතර, එම ව්‍යාපෘතියේ පවතින ගැටලු තත්ත්වය නිසා ඒවා අදාළ ව්‍යාපෘතිය සඳහා යොමු කිරීමට අවස්ථාවක් නොමැති බවත්, එම නිසා එම මුදල අදාළ අවස්ථාවේදී නිදහස් කර ලබාදෙන තෙක්, බැංකු වල පොලී අනුපාතය ද ඉහළ ගොස් ඇති නිසා ස්ථාවර තැන්පතුවක් දැමීම සුදුසු බවට යෝජනා කරන ලදී.

<u>ගරු මන්ත්‍රී ආර්.එම් කුමාරසිංහ මැතිතුමා</u> ව්‍යාපෘතියකට ගෙවීමක් සම්බන්ධයෙන් ලැබුණු මුදලක් නම්, අදාල ව්‍යාපෘතිය නිසියාකාරව ඉටු නොවී ගෙවීම් කිරීමට නොහැකි නම් එම මුදල යා යුත්තේ මහා භාණ්ඩාගාරයට බවත්, එසේ නොවන්නේනම් අභයපුර කාපට් මාර්ගයේ ව්‍යාපෘතිය තුළ පවතින ගැටලු ගැටලුකාරී තත්වය හා එහි ගිවිසුම් කාලය පිළිබඳව සොයා බැලිය යුතු බවත් පවසන ලදී. ස්ථාවර තැන්පතුවක් දැමීම තුළ ගැටලුකාරී බවක් නොමැති නම් විරුද්ධත්වයක් නොමැති බවද ප්‍රකාශ කරන ලදී.

<u>ගරු මන්ත්‍රී ඩී.පී බන්දුලසේන මැතිතුමා</u> එම ව්‍යාපෘතිය සඳහා ලැබුණු මුදල් ස්ථාවර තැන්පතුවක් දැමීම සම්බන්ධයෙන් ගැටලුකාරී තත්ත්වයක් නොමැති අතර ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව ස්ථිර කරන ලදී.

<u>ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතමා</u> **ඉදිරිපත් කල යෝජනාව සම්බන්ධයෙන් යම් විරෝධතාවයක් පවතින්නේ ද යන්න විමසූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූ බැවින් පුරනැගුම ව්‍යාපෘතිය සඳහා ලද මුදල් වලින් ස්ථාවර තැන්පතුවක් ආරම්භ කිරීම සඳහා වූ යෝජනාව පැමිණ සිටි සියළු මහජන නියෝජිතයන්ගේ ඒකඟතාවයෙන් සභා සම්මත විය**

**07.සුසාන භූමිය සඳහා ජල සම්බන්ධතා ලබා ගැනීම.**

<u>ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතමා</u> මේ වන විට තුලාන හතරක පමණ ජනතාව 238 ඥානික්කුලම සුසාන භූමිය භාවිතා කරන අතර මළ ගමක දී ජලය නොමැති වීම නිසා අසල්වාසී නිවෙස් හිමියන්ගෙන් වල කැපීම සඳහා ජලය ලබා ගන්නා අතර , ගෝල්ඩ් වේ ක්‍රීඩා සමාජය විසින් මෙම ජල සම්බන්ධතාවය සඳහා නඩත්තුව, ජල බිල්පත් පියවීම හා ආරක්ෂාව සම්බන්ධයෙන් කටයුතු කරන අතර ජල සම්බන්ධතාවය ලබා දෙන මෙන් ඉල්ලා සිටින ලදී. ඒ අනුව සුසාන භූමිය සඳහා ජලය ලබාදීමට අවශ්‍ය කටයුතු සිදු කිරීම සඳහා මෙම යෝජනාව ඉදිරිපත් කරන ලදී.

<u>ගරු මන්ත්‍රී බී.බී.ඊ ගයාන් චාමර මැතිතුමා</u> 238 ඥානික්කුලම පිහිටි මෙම සුසාන භූමිය සඳහා ජල පහසුකම නොමැති වීම තුළින් බොහෝ ගැටළු වලට මුහුණ පාන නිසා මේ පිළිබඳව අවධානය යොමුකර ජලය ලබා දීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව ස්ථිර කරන ලදී.

<u>ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතමා</u> **ඉදිරිපත් කල යෝජනාව සම්බන්ධයෙන් යම් විරෝධතාවයක් පවතින්නේ ද යන්න විමසූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූ බැවින් සුසාන භූමිය සඳහා ජල සම්බන්ධතා ලබා දීමේ යෝජනාව පැමිණ සිටි සියළු මහජන නියෝජිතයන්ගේ ඒකඟතාවයෙන් සභා සම්මත විය.**

**ඊ) කාරක සභාවල වාර්තා**

- 2022 නොවැම්බර් මස 08 වන දින මුදල් කමිටු වාර්ථාව සභා ගත කරන ලදී.

**එ) ලැබීම් ගෙවීම් මාසික වාර්තා**

- 2022 ඔක්තෝබර් මස ආදායම් හා වියදම් වාර්ථා මහ සභාවේ සලකා බැලීම සිදු කරන ලදී.

<u>ගරු මන්ත්‍රී ආර්.එම් කුමාරසිංහ මැතිතුමා</u> ගෙවීම් වාර්ථා වල පරිපාලන වියදම්, සේවක වැටුප්, මන්ත්‍රී දීමනා හැර අනෙකුත් ගෙවීම් සඳහා තමන් විරුද්ධ බව ප්‍රකාශ කරන ලදී.

**ඒ) රැස්වීම් කැඳවීමේ දැන්වීම් හා වෙනත් කාරණා ඉදිරිපත් කිරීම.**

**01.නිවාඩු දැනුම් දීම.**

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා ගරු මන්ත්‍රී පී.එස්.බී සිරිවර්ධන මැතිතුමා ,ගරු මන්ත්‍රී පී කරුණාරත්න මැතිතුමා මහ සභාවට නොපැමිණෙන බවට දන්වා යොමු කර තිබූ නිවාඩු ඉල්ලීම් මහ සභාවට ඉදිරිපත් කරන ලදී.

ගරු උප සභාපති එම්.සරත් ප්‍රේමචන්ද්‍ර මැතිතුමා අදාල නිවාඩු ඉල්ලුම් කර ඇති ගරු සභිකවරුන් වෙත නිවාඩු ලබා දීම සුදුසු බව සඳහන් කරන ලදී.

ගරු මන්ත්‍රී ආර්.එම් කුමාරසිංහ මැතිතුමා නෙළුබැවේ පොළවල් දෙකක් ඇති අතර ඉන් එකක් ක්‍රියාත්මක නොවන නිසා මේ සඳහා පිළියමක් යොදා තිබෙනවා ද යනුවෙන් හා බ්ලොග් ගල් මැෂිම මිලදී ගැනීම සඳහා රුපියල් ලක්ෂ 35 ක මුදල මේ වන විට ලැබී තිබේද යනුවෙන් විමසන ලදී. අසාර්ථක කොම්පෝස්ට් ව්‍යාපෘතිය ක්‍රියාත්මක වූ ඉඩම් සඳහා අයිතිය පිළිබඳව ගත් ක්‍රියාමාර්ගය කුමක්ද යනුවෙන් හා සෝලා පැනල් සවිකිරීමේ ව්‍යාපෘතියේ වර්තමාන තත්ත්වය පිළිබඳව ද විමසන ලදී. පසුගිය කාලයේ විශාල මාර්ග ප්‍රමාණයක් සංවර්ධන කටයුතු සඳහා ආරම්භ කළ අතර වර්ථමානයේදී ජනතාව එම මාර්ග තුළ ගමන් කිරීමට අපහසුවෙන් සිටින බවත්, පාසල් දරුවන් පවා මෙම මාර්ග වල ගමන් කරන්නේ ඉතා අපහසුවෙන් බවත් ප්‍රකාශ කරන ලදී. ශ්‍රාවස්තිපුර මංසන්ධියෙ මාර්ග සකසන විට කොන්ක්‍රීට් කාණු පද්ධතියක් යොදා ඇති නමුත් කඩවල් සඳහා ප්‍රවේශ වීමේ දී එම කාණු පද්ධතියෙ වස්න නොමැති බවත් මෙය අනාරක්ෂිත බවත් මේ පිළිබඳ අවධානය යොමු කරන ලෙස ඉල්ලා සිටින බවත් ප්‍රකාශ කරන ලදී .

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා නෙළුබැවේ දැනට ක්‍රියාත්මක නොවන පොළ භූමියේ කොන්ක්‍රීට් ගල් සෑදීම සඳහා වැඩපිළිවෙළක් සකස් කරන බවත්, බ්ලොග් ගල් මැෂිම මිලදී ගැනීම සඳහා මුදල් තවම ලැබී නොමැති බවත්, කොම්පෝස්ට් ව්‍යාපෘතිය ක්‍රියාත්මක වූ ඉඩමේ අයිතිය පිළිබඳව ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසන් සභාවට ඉල්ලීම් කළ නමුත් එහි අයිතිය අප ප්‍රාදේශීය සභාවට නොලැබුණු බවත්,
සෝලා පැනල් සවිකිරීමේ ව්‍යාපෘතිය සඳහා මේ දිනවල මේ මස 21 වන දින දක්වා ටෙන්ඩර් කැඳවන බවත් පවසන ලදී. මේ වන විට ගමන් කිරීමේ අපහසුතා සහිත මාර්ග සඳහා ග්‍රෙවල් කිරීමට අනුමත කර ඇති බවත් ප්‍රකාශ කරන ලදී.

ගරු මන්ත්‍රී පී.ටී සිරිසේන මැතිතුමා ශිෂ්‍යත්ව දරුවන්ගේ අධ්‍යාපන අවශ්‍යතාවය සඳහා පැවැත්වීමට නියමිත ශිෂ්‍යත්ව සම්මන්ත්‍රණය මෙම නොවැම්බර් මස විසි වන දින ජයබිම උත්සව ශාලාවේදි පැවැත්වීම සඳහා සියලු කටයුතු සංවිධානය කර ඇති බවත්, ඒ සඳහා ශිෂ්‍යත්ව දරුවන් සම්බන්ධ කරවීමට අවශ්‍ය කටයුතු සිදු කර දෙන ලෙස ඉල්ලා සිටින බවත්, ශිෂ්‍යත්ව සම්මන්ත්‍රණ මාලාව සාර්ථක කර ගැනීම සඳහා ගරු සභාපතිතුමා ඇතුළු ගරු මන්ත්‍රී මණ්ඩලයෙන් හා කාර්ය මණ්ඩලයෙන් විශාල සහයෝගයක් ලැබුණු බවත්, ඒ සඳහා තමාගේ ස්තුතිය පුද කරන බවත් ප්‍රකාශ කරන ලදී. එමෙන්ම ඉදිරියේදී අධ්‍යාපන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගය ඉලක්ක කර ගනිමින් සම්මන්ත්‍රණ මාලාවක් පැවැත්වීම සඳහා ද තමන් අදහස් කර ඇති බවත් එක් දරුවෙකුට රුපියල් දෙදහක් පමණ වටිනාකමින් යුතු අධ්‍යාපන උපකරණ ලබාදීමේ වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කිරීම සඳහා ද තමා කටයුතු සූදානම් කරන බවත් පවසන අතර නොවැම්බර් විසි වන දින පැවැත්වීමට නියමිත ශිෂ්‍යත්ව සම්මන්ත්‍රණය සඳහා ගරු සභාපතිතුමා න් ඇතුළු සියලුම ගරු මන්ත්‍රීතුමන්ලා ට සහ ගරු මන්ත්‍රීතුමියන්ලාට ද එම සම්මන්ත්‍රණය සාර්ථක කර ගැනීම සඳහා පැමිණෙන ලෙසට ආරාධනා කරමින් අදහස් දැක්වීම අවසන් කරන ලදී.

ගරු මන්ත්‍රී ඩී.පී බන්දුලසේන මැතිතුමා නොවැම්බර් විසි වන දින පවත්වන ශිෂ්‍යත්ව වැඩමුළුව සඳහා නිකුත් කර තිබෙන අත් පත්‍රිකාවේ, නෑනුප ප්‍රාදේශීය සභාවෙන් ශිෂත්ව දරුවන් සඳහා පිදෙන තිළිණයක් ලෙස හා සංවිධානය ප්‍රාදේශීය සභාවෙන් බව සඳහන් කර තිබෙන බවත්, එහි අවසානයේ සිරිසේන මන්ත්‍රීතුමාගේ දුරකථන අංකය සඳහන් කර ඇති බවත් පවසන ලදි. ඒ අනුව ගරු මහ සභාවේ අනුමැතිය රහිතව ඒ ආකාරයෙන් ප්‍රාදේශීය සභාව මගින් ශිෂ්‍යත්ව වැඩමුළුවක් සංවිධානය කිරීමට නොහැකි බවත් , එසේ සිදුකරන්නේ නම් මහ සභාවේ අනුමැතිය සහිතව ගරු මන්ත්‍රී මණ්ඩලයේ හා කාර්යමණ්ඩලයේ ප්‍රධානත්වයෙන් සිදුවිය යුතු බවත්, නැතිනම් මේ ආකාරයෙන් ප්‍රාදේශීය සභාවේ නම ඉදිරිපත් කිරීම සඳහා නීතියානුකූල අයිතියක් නොමැති බවත් පවසන ලදි.

ගරු මන්ත්‍රී එස්.ඒ.කේ.පී ගුණවර්ධන මැතිතුමා ගියවර මහා සභාවේ දී ශිෂ්‍යත්ව සම්මන්ත්‍රණය සඳහා ගෙන ආ යෝජනාව සිරිසේන මන්ත්‍රීතුමාගේ පුද්ගලික යෝජනාවක් ලෙස ඉදිරිපත් වූ බවත්, එහිදී තීරණය වූයේ සංග්‍රහ කටයුතු සඳහා රුපියල් 40,000 කට යටත්ව සභාව විසින් දීමනාවක් ගෙවීම පිළිබඳ බවත් එම නිසා මෙම අත් පත්‍රිකාව තුළ සඳහන් වී ඇති ආකාරය පිළිබඳව ගැටළුකාරී තත්වයක් තිබෙන බවත් , ඒ සඳහා ගරු සභාපතිතුමා ගේ අවධානය යොමු කළ යුතු බවත් පවසන අතර ජයබිම උත්සව ශාලාවේ දරුවන් තුන් සියයක් පමණ ප්‍රමාණයක් වාඩි කරවීම සඳහා ඉඩ පහසුකම් නොමැති බවත් ඒ සඳහා අවශ්‍ය වැඩපිළිවෙළක් ද යොදන මෙන් ප්‍රකාශ කරන ලදී.

ගරු මන්ත්‍රී ආර්.එම් කුමාරසිංහ මැතිතුමා අධ්‍යාපනය ලබන දරුවන් සඳහා සම්මන්ත්‍රණ පැවැත්වීම ඉතා හොඳ කටයුත්තක් බවත්, මෙය සෑම වසරක් පාසාම ශිෂ්‍යත්ව දරුවන් සඳහා මෙන්ම සාමාන්‍ය පෙළ දරුවන් සඳහා ද අවම වශයෙන් අත්‍යවශ්‍ය විෂයයන් තුනක් සඳහාද එහිදී ගණිතය විද්‍යාව හා ඉංග්‍රීසි යන විෂයයන් ඇතුලත් කර සම්මන්ත්‍රණ මාලාවක් පැවැත්වීම සුදුසු බවත්, මේ සඳහා ප්‍රාදේශීය සභාවක් වශයෙන් අවශ්‍ය ප්‍රතිපාදන වෙන් කර සිදු කිරීම යෝග්‍ය බවත් ප්‍රකාශ කරන අතර මේ ආකාරයෙන් ශිෂ්‍යත්ව සම්මන්ත්‍රණයක් පැවැත්වීම සඳහා සිරිසේන මන්ත්‍රීතුමා යෝජනා කිරීම සම්බන්ධයෙන් ද ස්තූතිය පුද කරමින් අදහස් දැක්වීම අවසන් කරන ලදී.

ගරු මන්ත්‍රී කේ. හැරිසෙන්ස් මැතිතුමා 20 වනදා පැවැත්වීමට නියමිත ශිෂ්‍යත්ව වැඩසටහන සඳහා සිදු කළ යෝජනාව ගියවර මහා සභාවේ දී ඉදිරිපත් වූයේ සිරිසේන මන්ත්‍රීතුමාගේ යෝජනාවක් ලෙස බවත් එහිදී ප්‍රාදේශීය සභාව විසින් සංග්‍රහ සඳහා 40,000 ට යටත්ව ගෙවීමක් සිදු කිරීම සඳහා තීරණය වූ බවත් අද මහා සභාවේ දී මේ පිළිබඳව වෙනත් ආකල්පයක් ආරෝපණය කර ඉදිරිපත් කිරීම නුසුදුසු බවත් ගියවර සභාවේ සිටි සියලුම මන්ත්‍රීවරුන් ඒ පිළිබඳව දන්නා බවත් , ඒ අනුව අනාගතයේදී ද මේ ආකාරයෙන් සභා සම්මත කරන යෝජනාවට වෙනස් ආරෝපණයක් සිදු නොකරන ලෙසට ඉල්ලීම් කරමින් ප්‍රකාශ කරමින් අදහස් දැක්වීම අවසන් කරන ලදී.

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා ශිෂ්‍යත්ව දරුවන් සඳහා ශිෂ්‍යත්ව වැඩමුළුවක් පැවැත්වීමේ යෝජනාව ගිය මහා සභාවේදී සියලුම මන්ත්‍රී තුමන්ලාගෙ විරුද්ධත්වයකින් තොරව සම්මත වූ බවත්, එහිදී රුපියල් හතළිස් දාහකට යටත්ව ප්‍රාදේශීය සභාව මැදිහත් වී මෙම සම්මන්ත්‍රණය සිදු කිරීම සඳහා තීරණය වූ බවත් එහිදී සිරිසේන මන්ත්‍රීතුමා ශිෂ්‍යත්ව දරුවන් කැඳවීම සඳහා මූලිකත්වය ගත් බවත්, ශිෂත්ව සම්මන්ත්‍රණය සම්බන්ධයෙන් ප්‍රචාරණ කටයුතු සිදු කිරීම, ජයබිම උත්සව ශාලාව ලබාදීම ආදී කටයුතු ප්‍රාදේශීය සභාව විසින් සිදු කිරීම සඳහා ද එහිදී තීරණය වූ නිසා මේ තුළ වැරැද්දක් නොමැති බවට ප්‍රකාශ කරන ලදී.
ප්‍රදේශයේ ජනතාවගේ සුභ සිද්ධිය උදෙසා තීන්දු තීරණ ගැනීම වෙනුවෙන් ගෞරවයෙන් සහයෝගය දැක්වූ ගරු මන්ත්‍රීතුමන්ලා වෙත හා ගරු මන්ත්‍රීතුමියන්ලා වෙත ස්තූතිය ප්‍රකාශ කරමින් 2022.11.18 වන දින පැවැත්වූ මහ සභා රැස්වීම ප.ව 11.40 ට අවසන් කරන ලද අතර එළබෙන මහ සභාව 2022.12.16 වන දින පෙ.ව 10.00 පැවැත්වෙන බව සඳහන් කරන ලදී.

| | |
|---|---|
| ..................................... | .......................................... |
| ලේකම්, | සභාපති , |
| නැ. නු. ප ප්‍රාදේශීය සභාව, | නැ. නු. ප්‍රාදේශීය සභාව, |
| විජයපුර. | විජයපුර. |